විශිෂ්ට පරමාදර්ශී අභිමානවත් පළාත් රාජ්‍ය සේවයක්

පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව - බස්නාහිර පළාත

மாகாண அரசாங்க சேவை ஆணைக்குழு - மேல் மாகாணம்

PROVINCIAL PUBLIC SERVICE COMMISSION - WESTERN PROVINCE

අංක 628,10 වන මහල,ජන ජය සිටි ගොඩනැගිල්ල,නාවල පාර,රාජගිරිය/இல.628, 10 வதுமாடி, ஜனஜயசிட்டிவளாகம், நாவலவீதி, ராஜகிரிய/No.628,10th Floor,Jana Jaya City Building,NawalaRoad,Rajagiriya

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My Ref. | WPC/PSC/REC/03/ සමු.සං.නිල.<br>III ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීම | ඔබේ අංකය<br>உமது இல.<br>Your Ref. | | දිනය<br>திகதி<br>Date | 2025.02. 05 |

**<u>බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර (තාක්ෂණික) සේවා ගණයේ සමුපකාර සංවර්ධන නිලධාරී III ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීම (සීමිත) - 2023</u>**

2024.12.12 දින බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් පවත්වන ලද උක්ත සඳහන් තරඟ විභාගයේ ප්‍රතිඵල මත **ඇමුණුම්-01** නාමලේඛනයේ නම් සඳහන් අයදුම්කරුවන් සීමිත පදනම මත බස්නාහිර පළාත් සභා රාජ්‍ය සෙවයේ සමුපකාර සංවර්ධන නිලධාරී තනතුරේ III ශ්‍රේණියට පත් කිරීම සම්බන්ධයෙන් සුදුසුකම් පරීක්ෂා කිරීමේ සම්මුඛ පරීක්ෂණය **2025.02.11** දින බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේදී පැවැත්වීමට කටයුතු යොදා ඇත. සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවීමේ ලිපිය ඔබගේ සේවා ස්ථානය වෙත යොමු කර ඇත.

02. ඔබ විසින් අයදුම්පතෙහි සඳහන් කල ජංගම දුරකථන අංකය සඳහා නිල කෙටි පණිවුඩයක් මගින්ද සම්මුඛ පරීක්ෂණ පැවැත්වෙන දිනය හා වේලාව දන්වා ඇත. නියමිත දින නියමිත වේලාවට ඒ සඳහා සහභාගී වන ලෙස මෙයින් දන්වනු ලැබේ. සම්මුඛ පරීක්ෂණය සඳහා පැමිණෙන විට පහත සඳහන් ලියවිලි සහ ඒවායේ සහතික කරන ලද ඡායා පිටපත්ද රැගෙන ඒම අනිවාර්යය වේ.

i. උප්පැන්න සහතිකය

i. ජාතික හැඳුනුම්පත හෝ වෙනත් වලංගු හැඳුනුම්පතක්

ii. විභාග දෙපාර්තමේන්තුවෙන් නිකුත් කරන ලද අ.පො.ස. (සා.පෙළ) හා අ.පො.ස.(උ.පෙළ) සහතිකයන්හි මුල් පිටපත්

iii. සමුපකාර සංවර්ධන නිලධාරී III ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීමේ දැන්වීමට අනුව වෘත්තිය සුදුසුකම් සනාථ කිරීම සඳහා වන සහතිකයන්හි මුල් පිටපත සහ එහි සවිස්තරාත්මක ප්‍රතිඵල සහතිකය (Detailed Certificate)

iv. දැනට දරණ ස්ථිර තනතුරේ පත්වීම් ලිපිය

v. බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ නියුතු සුදුසුකම් සපුරා ඇති නිලධාරියෙකු හා පාලන චක්‍රලේඛ 04/2021 අනුව විනය දඬුවම් ලබා නොමැති බවට දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් ලබා ගන්නා ලද සේවා සහතිකයක්

*සැ.යු : ඔබ භාවිතා කරන නමෙහි සහ උප්පැන්න සහතිකයේ සහ අනෙකුත් සහතිකවල සඳහන් නමෙහි වෙනසක් ඇත්නම් එම වෙනස පැහැදිලි කිරීම සඳහා විධිමත් ආකෘතියකින් යුත් රු.50/-ක අවලංගු නොකරන ලද මුද්දරයක් මත ඔබගේ අත්සන තබා සාමදාන විනිසුරුවරයකු හෝ දිවුරුම් කොමසාරිස්වරයකු විසින් සහතික කරන ලද දිවුරුම් ප්‍රකාශයක්*



| ලේකම්<br>செயலாளர்<br>Secretary | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්<br>சிரேஷ்ட உதவிச் செயலாளர்<br>Senior Assistant Secretary | සහකාර ලේකම් (බඳවාගැනීම්)<br>உதவிச் செயலாளர் (ஆட்சேர்ப்பு)<br>Assistant Secretary (Recruitment) | සහකාර ලේකම් (ආයතන)<br>உதவிச் செயலாளர் (தாபனம்)<br>Assistant Secretary (Establishment) | පරිපාලන නිලධාරී<br>நிர்வாக உத்தியோகத்தர்<br>Administrative Officer | කාර්යාලය / அலுவலகம் / Office: 011 2879613, 011 2879614<br>ෆැක්ස් / தொலைநகல் / Fax: 011 2879512<br>ඊ-මේල් / மின்னஞ்சல் / E-Mail: ppscwpsc@sltnet.lk |
|---|---|---|---|---|---|
| 011 2879528 | 011 2879317 | 011 2879610 | 011 2879538 | 011 2879517 | |

03. ඉහත V. හි සඳහන් සේවා සහතිකය, ඔබගේ පෞද්ගලික ලිපිගොනුව පවත්වාගෙන යන සේවා ස්ථානයේ ප්‍රධානියා විසින් සම්පූර්ණ කර, **2025.02.11** දිනට පෙර මෙම කාර්යාලය වෙත ලැබීමට සැලැස්විය යුතුය. එසේම ඉහත සඳහන් ලේඛන සත්‍ය පිටපත් බවට සහතික කළ යුත්තේ ද එම සේවා ස්ථානයේ ප්‍රධානියාම වේ.

උදාහරණයක් ලෙස පළාත් පාසලක සේවය කරන නිලධරයකු සම්බන්ධයෙන් එම කටයුතු කළ යුත්තේ අදාළ කලාප අධ්‍යාපන කාර්යාලයේ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ මගිනි.

04. නියමිත දිනයේ සම්මුඛ පරීක්ෂණයට නොපැමිණීම පත්වීමක් ලබාගැනීම සඳහා අපේක්ෂාවක් නොමැති සේ සලකනු ලබන අතර, ඒ සම්බන්ධයෙන් පසුව කරනු ලබන කිසිදු විමසීමක් මොනම කරුණක් මත හෝ සලකා බලනු නොලැබේ.

05. මෙම සම්මුඛ පරීක්ෂණය සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා කැඳවීමක් පමණක් වන අතර, එය පත්වීමක් ලබා ගැනීමට ඇති අයිතියක් නොවන බවද, මෙම ලිපිය නිකුත් කිරීමෙන් පමණක් පත්වීමක් ලැබීමට සුදුස්සකු නොවන බවද අවධාරණය කරනු ලැබේ. එසේම මෙම සම්මුඛ පරීක්ෂණයට පැමිණීම වෙනුවෙන් ගමන් වියදම් හෝ වෙනත් කිසිදු දීමනාවක් ගෙවනු නොලැබේ.

06. මෙම කැඳවීම අනුව ඔබ නොපැමිණෙන්නේ නම්, ඒ බව සම්මුඛ පරීක්ෂණයට පෙර ලිඛිතව හෝ ppscwprec@gmail.com යන විද්‍යුත් තැපැල් ලිපිනයට විද්‍යුත් තැපැල් පණිවිඩයක් මගින් මා දැනුවත් කරන මෙන් දන්වා සිටිමි.

07. සියලුම අයදුම්කරුවන්ට අදාළ කැඳවීම් ලිපි තැපැල් මගින් යොමු කිරීමට කටයුතු කරන අතර යම් හෙයකින් එම ලිපිය ලැබීමට ප්‍රමාද වන්නේනම් මෙම දැන්වීම අනුව සම්මුඛ පරීක්ෂණයට අවශ්‍ය ලේඛන පිළියෙල කර ගන්නා ලෙස කාරුණිකව දන්වා සිටිමි.

තිලක් සෙනරත්
ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
බස්නාහිර පළාත.

**බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර (තාක්ෂණික) සේවා ගණයේ සමුපකාර සංවර්ධන නිලධාරී III ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීම (සීමිත) - 2023**

| අනු අංකය | මුලකුරු සමඟ නම | ජා.හැ.අං | මාධ්‍යය |
|---|---|---|---|
| 01 | බී.කේ.කේ.පෙරේරා | 199200800650 | සිංහල |
| 02 | ජී.එච්.එම්.සී.ප්‍රියදර්ශනී | 816795079V | සිංහල |
| 03 | කේ.ජී.වී.මධුශිකා | 198278103842 | සිංහල |
| 04 | පී.ජී.ඒ.එස්.කුමාරි | 197772200497 | සිංහල |

2023/02/05